www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද්ධය තීව්‍ර කිරීම සඳහා විදේශ දූත පිරිස වෙත එල්ල වූ ප්‍රහාරය යොදා ගැනීමට ශ්‍රී ලංකා ආන්ඩුව මාන බලයි

## Sri Lankan government exploits attack on foreign delegation to intensify war

**සරත් කුමාර විසිනි**
**2007 මාර්තු 3**

දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊයට) එරෙහි දැඩි ක්‍රියාවකට යාම සඳහා විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයින් රැගෙන යමින් සිටි හමුදා හෙලිකොප්ටර් යානයක් වෙත එම බෙදුම්වාදී කැරලිකරුවන් විසින් අඟහරුවාදා දින එල්ල කල ප්‍රහාරයක වාසිය ශ්‍රී ලංකා ආන්ඩුව විසින් ඩැහැ ගෙන ඇත.

විදේශ දූත පිරිසේ ප්‍රධානි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිත ද එක්සත් ජනපද, ජර්මානු, කැනේඩියානු සහ ප්‍රන්ස තානාපතිවරුන් ද, ඇතුලු නිලධාරීහු ආපදා කලමනාකරන සහ මානව හිමිකම් පිලිබඳ අමාත්‍යය මහින්ද සමරසිංහ සමග නැගෙනහිර පලාතේ පිහිටි මඩකලපුව නගරයේ සංචාරය කරමින් සිටියහ.

මෙම දූත පිරිසට කාලතුවක්කු සහ මෝටාර් ප්‍රහාරවලට ගොදුරු වීමට සිදු වූයේ හමුදා ගුවන් ධාවන පථයේ බැස ගත්තායින් පසුව ය. තම හිසට බෝම්බ කැබිලිතිවලින් සුලු තුවාල ලත් ඉතාලියානු තානාපති පියෝ මරියානි රෝහලකට ගෙනයන ලදී. අනෙකුත් රාජ්‍ය තාන්ත්‍රිකයින් කිහිප දෙනෙකුට හා හමුදා භටයින් කිහිප දෙනෙකුට සුලු තුවාලවලට ගොදුරු වීමට සිදු විය.

පසු ගිය ජුලි මස සිට ශ්‍රී ලංකා හමුදාව නැගෙනහිර පලාතේ ප්‍රහාර මාලාවක් දියත් කර ඇත. 2002 ගිවිස ගත් සටන් විරාම ගිවිසුම විවෘතව උල්ලංඝනය කරමින්, එල්ටීටීඊය යටතේ පැවති මාවිල්ආරු, සාම්පූර්, සහ ඉතා මෑත දී වාහරෙයි එය (හමුදා) අල්ලා ගත්තේය. හමුදා මෙහෙයුම් දස දහස් සංඛ්‍යාත ජනතාව ආස්ථානගත වීමට තුඩු දුනි. විදේශ නිලධාරීන් විසින් මෙම දිස්ත්‍රික්කයේ අවතැන්වූවන්ගේ වූවන්ගේ "මානව හා සංවර්ධනය පිලිබඳ කරුනු" සාකච්ඡා කිරීමට නියමිතව තිබින.

ජාත්‍යන්තර දූත පිරිස වෙත සිතාමතා ප්‍රහාර එල්ල කලේ යයි එල්ටීටීඊය ට චෝදනා නගමින් රජය සහ හමුදා නිලධාරීන් විසින් ක්ෂනිකව ම ප්‍රචාරක ප්‍රහාරයන් දියත් කලහ. "මනුෂ්‍ය ජීවිත පිලිබඳ අනුකම්පා විරහිත නොතැකීම මෙන්ම දෙමල කොටි ත්‍රස්තවාදයට එරෙහි ජාත්‍යන්තර හෙලා දැකීම් හමුවේ උද්ධච්ඡකම හා නොතැකීම පෙන්නුම් කිරීමක්" ලෙස හෙලා දකිමින් වොෂින්ටනයේ ශ්‍රී ලංකා තානාපති විසින් ප්‍රකාශනයක් නිකුත් කෙරින.

කෙසේ වෙතත් "ආරක්ෂක හේතුන් මත" සංචාරය පිලිබඳව එල්ටීටීඊයට දැනුම් නොදී තිබුනු බව හමුදා ප්‍රකාශක බ්‍රිගේඩියර් ප්‍රසාද් සමරසිංහ පිලි ගත්තේ තව දුරටත් "විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයින් මඩකලපුවට සංචාරය කරමින් සිටින බව හොඳාකාරව දන්නා කාරනාවක් බව පවසමින්, ප්‍රහාරය සිතා මතා කරන ලද්දක් බව ඔහු යලි යලිත් පැවසුවේය. තම ප්‍රකාශයේ පවතින පැහැදිලි පරස්පරය ඔහු පැහැදිලි කලේ නැත. එනම් එය "හොඳාකාරව දන්නා වූ කාරනවක්" නම්, එල්ටීටීඊයට නොදැන්වීමට තිබුනු "ආරක්ෂක හේතු" කවරේද?

සිද්ධිය පිලිබඳව "දැඩි ශෝකය" ක්ෂනිකව ම, පලකල එල්ටීටීඊ යේ හමුදා ප්‍රකාශක රාසයියා ඉලන්තිරයන් හමුදාවට චෝදනා කලේ මෙම සංචාරය ගැන තමන්ට නොදැන්වූ බවය. ඔහු පැහැදිලි කලේ මෙම ප්‍රදේශයේ විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයින් සිටිනා බව එක්සත් ජාතීන්ගේ නිලධරයෙක් වන මරියන් ඩින් තමන්ට දැන් වූ විට එල්ටීටීඊය ක්ෂනිකව ප්‍රහාරය නැවැත්වූ බව ය. ඔහු කියා පෑවේ එම උදෑසන හමුදාව විසින් එල්ල කරන ලද කාලතුවක්කු ප්‍රහාර මාලාවකට එල්ටීටීඊය ප්‍රතිචාර දැක් වූ බවය.

ජාත්‍යන්තර දූත පිරිසක සාමාජිකයින්ට ප්‍රහාර එල්ල කිරීම මගින් එල්ටීටීඊයට අත් කර ගත හැකි වාසියක් නැත. ඇත්ත වශයෙන් ම, තම වැඩිවෙමින් පවතින හුදකලාව තුනී කර ගැනීම සඳහා ඊනියා ජාත්‍යන්තර

ප්‍රජාව සැනසවීමේ මංමුලාගත උත්සාහයක එල්ටීටීඊ නායකත්වය යෙදී සිටියි. එල්ටීටීඊයට එරෙහිව දැඩි පියවරයන් සඳහා පීඩනය එල්ල කරමින් සිටින කොලඹ ආන්ඩුව මෙම ප්‍රහාරයෙන් යම් මරනයක් හෝ බරපතල අනතුරක් සිදුවූයේ නම් එය විවෘතව තම වාසියට හරවා ගැනීමට ඉඩ සලසාගත හැකි ව තිබින.

"විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයන් සිටින බව තමන් නොදන්නා බව කොටින් (එල්ටීටීඊය) කීව ද, කොටීන් සිවිල් ජනයා එල්ල කරන බව ශ්‍රී ලංකා ආන්ඩුව චෝදනා කරයි," යනුවෙන් එක්සත් ජනපදය පාදක කොට ගත් ස්ට්‍රැට්ෆෝර් නමැති බුද්ධි ආයතනය විස්තර කලේය. " ඒ කොයි සිද්ධියකදී වුව, තම චරියාව ඉස්මතු කර පෙන්වූ කොටින්, තමන්ට එරෙහි ව, වොෂින්ටනයෙන් හා යුරෝපීය සංගමයෙන් වැඩි වැඩියෙන් හමුදා ආධාර සහ සහාය ලබා ගැනීමට ශ්‍රී ලංකා ආන්ඩුවට කදිම අවස්ථාවක් සලසා දුනි."

ශ්‍රී ලංකා හමුදාව විසින් මෙම දූත පිරිස ප්‍රහාර එල්ල විය හැකි පෙරමුනකට සිතා මතා යැවීම බැහැර කල නොහැක. කොලඹ පදනම් වූ ඩේලි මිරර් පුවත් පත ඊයේ ලිපියක සටහන් කලේ (දූත පිරිස සිටි) හෙලිකොප්ටර් යානය ගොඩ බැස්සවීමට යන්තම් පැය භාගයකට පෙරාතුව ගුවන් ධාවන පථයට කි.මී. 2ක් එපිටින් පිහිටි හමුදා කඳවුරක් මෝටර් ප්‍රහාරවලට ලක් වූ බව ය. "එමනිසා නිශ්චිතව එහි ආරක්ෂක අනතුරක් පැවැති අතර හෙලිකොප්ටර් යානය වඩා සුරක්ෂිත ස්ථානයක් කරා නැවත යැවිය යුතුව තිබින" යනුවෙන් ආරක්ෂක තොරතුරු මාධ්‍යයක් පුවත් පතට පැවසුවේය.

ආන්ඩුව සහ තම දේශපාලන සගයින් මෙම සිද්ධිය තම වාසියට හරවා ගැනීමට යත්න දැරූහ. " ත්‍රස්තවාදයේ පීඩාවට ආමන්ත්‍රනය කිරීමේත් ත්‍රස්තවාදය අතහැර එල්ටීටීඊයට ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට එන ලෙස පීඩනය යෙදීමේත් ශ්‍රී ලංකා ආන්ඩුවේ ප්‍රයත්නයට සහාය දෙන ලෙස ජාත්‍යන්තර ප්‍රජාව" ට විදේශ ඇමති රෝහිත බෝගොල්ලාගම ආයාචනය කලේය."විදේශ රටවල එල්ටීටීඊය විසින් සිදු කරන අරමුදල් එකතු කිරීමත් ආයුධ මිලදී ගැනීමත් නැවැත්වීමට ඵලදායි පියවර ගන්නා ලෙස" ඔහු ඉල්ලා සිටියේ ය.

ජාත්‍යන්තර ප්‍රතිචාර මුනිවත රකිනා බවක් පෙන්වීය. "සිවිල් පුරවැසියන්ගේත් මානුෂීය ක්‍රියාධරයන්ගේත්, ආන්ඩුවේ නිලධාරීන්ගේත් සහ ජාත්‍යන්තර ප්‍රජාවගේත් ජීවිත ගැන මුලුමනින්ම නොතැකීම," ගැන හෙලා දුටු එක්සත් ජාතීන්ගේ මහලේකම් බන් කි-මූන් ඒ සමගම සාම සාකච්ඡාවලට ආයුතු බව ඉල්ලා සිටියේ ය. මෙවැනි ප්‍රකාශ, යුරෝපීය සංගමය මෙන්ම අනෙකුත් රටවල් ද නිකුත් කලහ. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව පැවසුවේ මෙම ප්‍රහාරය තානාපතිවරුන් වෙත විශේෂයෙන් එල්ල කලා විය නොහැකි බව ය.

ශ්‍රී ලංකා හමුදාව, ක්ෂනිකව ම මඩකලපුව අසල පිහිටි එල්ටීටීඊ යටතේ පවතින වච්නතීවු ප්‍රදේශයට ගුවනින් ප්‍රති ප්‍රහාර එල්ල කලේ ය. හමුදාව කියාපෑවේ ජාත්‍යන්තර දූත පිරිස වෙත කාල තුවක්කු ප්‍රහාර පැමිනියේ එම ප්‍රදේශයේ සිට යනුවෙනි. බදාදා, නාවික හමුදාව මුලතිව් අසල ප්‍රධාන එල්ටීටීඊ මුහුදු කොටි කඳවුරක් ආක්‍රමනය කලේ ය. බ්‍රහස්පතින්දා, මුලතිව් දිස්ත්‍රික්කයේ ම, එල්ටීටීඊ පුහුනු කඳවුරක් බව කියා පෑ ස්ථානයකට ගුවන් හමුදාව බෝම්බ හෙලී ය.

මඩකලපුව සිද්ධිය හටගත්තේ ශ්‍රී ලංකාව තුල සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමේ පස්වන සංවත්සරයෙන් දින පහකට පසුව ය. සටන් විරාම ගිවිසුම අධීක්ෂනය කිරීමට භාරවී ඇති ශ්‍රී ලංකා සටන් විරාම කොමිටිය ප්‍රකාශනයක් නිකුත් කරමින්, 2005 නොවැම්බර් මස මැතිවරනය යන්තම් ජයගත් ජනාධිපති මහින් ද රාජපක්ෂ වෙත සටන් විරාම ගිවිසුම බිඳ වැටීමේ වගකීම වැඩිමනක් පැවරෙන බව අවධාරනය කලේ ය.

2005 නොවැම්බරයට පෙර වසර තුන තුල, එල්ටීටීඊ ය හා හමුදාව අතර ඇති වූ සිද්ධිවලින් හා ගැටුම් හේතුවෙන් මිනිසුන් 130 පමනක් මරනයට ගොදුරු වූ බව සටන් විරාම කොමිටිය වාර්තා කලේ ය. පසු ගිය මාස 15 පුරා, අවම ලෙස 4,000ක් සිවිල් වැසියෝ, හමුදා හා පොලිස් පිරිස් සහ එල්ටීටීඊ සටන්කරුවන් වර්ධනය වෙමින් පැවැති යුද්ධයට ගොදුරු වූහ.

ආන්ඩුව සටන් විරාම ගිවිසුම අහෝසි කර නැතැයි පෙන්නුම් කෙරෙන හාස්‍ය ජනක ප්‍රකාශනයක් ආන්ඩුවේ ඊනියා සාම කාර්යාලය මගින් නිකුත් කෙරින. ඒ සමග ම, එය "නීතිය ආරක්ෂා කිරීමේත් රටේ සියලු පුරවැසියන්ගේ මානව අයිතීන් ගරු කිරීම තහවුරු කිරීමේත්, රජයේ අඛන්ඩ ප්‍රයත්නයන්, ආරක්ෂා කලේ ය. ,එල්ටීටීඊය විසින් මහජනතාවගේ අයිතීන් දරුනු ලෙස උල්ලංඝනය කර ඇති දැනට එල්ටීටීඊ පාලනය යටතේ පවත්නා ප්‍රදේශවල මෙම තත්වය ඇති කිරීමට ආන්ඩුව ඇප කැප වී සිටියි.,

පැහැදිලිව ම, "මානව අයිතීන්" සහ "නීතිය" තහවුරු කිරීම යනුවෙන් රජය කියනු ලබන දැහි එකම අරුත වන්නේ එල්ටීටීඊ පාලන ප්‍රදේශවලින් එල්ටීටීඊ ය පලවා හැරීම යි. වෙනත් වචනවලින් පවසතොත්, "මානව අයිතීන්" ගේ නාමයෙන් තම නිවෙස්වලින් දස දහස්

සංඛ්‍යාත සිවිල් ජනයා පලවා හරිමින් ද සිය ගනන් ඝාතනයට ලක් කරමින්ද, සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කරමින් කෙරෙන හමුදා කඩා පැනීම් සඳහා රාජපක්ෂ නියෝග කලේ ය. "නීතිය" ආරක්ෂා කිරීමේ නාමයෙන් නඩු විභාග නොමැතිව හිතුවක්කාර ලෙස රඳවා ගැනීමට ඉඩ හරින කෲර නීති ක්‍රියාවේ යොදවා ඇති ආන්ඩුව, මෙම දූපතේ වෙසෙන දෙමල සුලුතරය ත්‍රස්ත කිරීමට හමුදා සහය ලත් ඝාතන කල්ලි ගෙනයන වැඩ පිලිවෙල ගැන මුනිවත රකියි.

පසු ගිය ඉරිදා රූපවාහිනියට කරුනු දැක්වීමේ දී ජනාධිපති එක එල්ලේ ප්‍රකාශ කලේ තමන්ට " සටන් විරාම ගිවිසුම බාධාවක් නොවන නිසා එය ගැන කරදර, නොවන" බව ය. මෙය, වර්ගවාදී යුද මඩ ගොහොරුවේ මුලු රට ම කිඳා බැස්සවීමේ ආන්ඩුවේ සූදානම ප්‍රකාශ කිරීමකි.

© www.wsws.org